# විශ්ලේෂණ සටහන

## ශ්‍රී ලංකාවේ මැතිවරණ කාලය තුළ පුද්ගලික මාධ්‍ය නියාමනය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව සතු බලතල

2019 නොවැම්බර්

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා මැතිවරණ කාලය තුළ මාධ්‍ය නියාමනය කිරීම සම්බන්ධව ශ්‍රී ලංකාවට ඇත්තේ තරමක දිගු ඉතිහාසයකි. මාධ්‍ය උපමාන නිකුත් කරමින් මාධ්‍ය නියාමනය කිරීමට ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බලය පවතී.[1] මැතිවරණවලදී මාධ්‍ය නියාමනය සම්බන්ධ වර්තමාන සාකච්ඡාව මගින් අවධානය යොමු කරන්නේ රාජ්‍ය මාධ්‍ය නියාමනය කිරීම සඳහා මෙම උපමාන යොදාගෙන ඇති ආකාරයයි. මෙම කෙටි විශ්ලේෂණය මගින් මැතිවරණ කාල සීමාව තුළ පුද්ගලික මාධ්‍ය නියාමනය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව බලය ලබා දී ඇති ආකාරය විමසා බලයි.

## පුද්ගලික මාධ්‍ය නියාමනය කිරීම විෂයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (5) (අ) වගන්තියේ සඳහන් වන්නේ, 'ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම විෂයෙහිලා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන උපමාන, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් උචිත යයි සලකනු ලබන යම් ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවයක් පවත්වා ගෙන යන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු හෝ ප්‍රකාශකයකු වෙත කලින් කල නිකුත් කිරීමේ බලය කොමිෂන් සභාවට තිබිය යුත්තේය' යනුවෙණි.

104ආ (5) (අ) වගන්තියට අනුව, මැතිවරණ කාල සීමාවක් තුළ සියලූම මාධ්‍ය නියාමනය කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට ව්‍යවස්ථානුකූලව බලය පවතී. කොමිෂන් සභාවේ බලතල රාජ්‍ය මාධ්‍යයට පමණක් සීමා නොවී සියලූම මාධ්‍ය ආවරණය කරන අතර ඊට පෞද්ගලික මාධ්‍ය ද අයත් වේ.[2]

## 2019 මාධ්‍ය උපමානවල විෂය පථය

[1] මීට පෙර නිකුත් කරන ලද මාධ්‍ය උපමාන සඳහා 2017 මාර්තු 3 දිනැති අංක 2008/28, 2017 දෙසැම්බර් 4 දිනැති අංක 2048/1 සහ 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 යන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර බලන්න.

[2] මීට පෙර අවස්තාවක දී ශ්‍රේෂ්ඨාධිකරණය කියා සිටියේ විකාශන මාධ්‍යවලට මහජනතාවගේ අයිතිවාසිකම් හා අවශ්‍යතා කෙරෙහි සංවේදී වීමට වැඩි වගකීමක් ඇතී බවයි. ප්‍රනාන්දු එදිරිව. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 1996 (1) ශ්‍රී ලංකා නීති වාර්තා, පිටුව 157 ශ්‍රේෂ්ඨාධිකරණය තවදුරටත් කියා සිටියේ විකාශන මාධ්‍ය එහි ස්වභාවය අනුව ම මුද්‍රිත මාධ්‍යයට වඩා වෙනස් ය. ගුවන් තරංග යනු පොදු දේපළකින් ඒවා මහජන යහපත සඳහා යොදා ගැනීම සහතික කිරීම රජයේ වගකීමකි. යනුවණේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව 2019 සැප්තැම්බර් 21 දින මැතිවරණ කොමිෂන් සභාව නිදහස් හා සාධාරණ ජනාධිපතිවරණයක් සහතික කිරීම පිණිස මාධ්‍ය උපමාන නිකුත් කළේය.[3] 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දුන් 104 ආ (5) (අ) වගන්තිය යටතේ මෙම උපමාන නිකුත් කරන ලදී.[4]

මෙම උපමානයන්ට මැතිවරණ කාල සීමාව තුළ මධ්‍යස්ථභාවය හා අපක්ෂපාතීත්වය පවත්වා ගැනීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය සතු වගකීම් සහ යුතුකම් ඉතා පුළුල් ලෙස ඇතුළත් වේ. මෙම වගකීම් සියලූම මාධ්‍යයන්ට අදාළ වේ. එනම් (1) හිමිකාරිත්වය, එනම් රජය සතු හෝ පුද්ගලික අයිතියක් සහිත හා (2) මාධ්‍ය වර්ගය, එනම් මෙම උපමානයන් ගුවන්විදුලි, රූපවාහිනී, මුද්‍රිත සහ සමාජ මාධ්‍ය සඳහා අදාළ වේ. නිදසුනක් වශයෙන්, උපමානයන්ට අනුව සෑම ගුවන්විදුලි, රූපවාහිනී සහ මුද්‍රිත මාධ්‍යයක්ම මැතිවරණයක් සම්බන්ධ කාරණා වාර්තා කිරීමේදී මධ්‍යස්ථ හා අපක්ෂපාතී විය යුතු අතර තරග කරන ඕනෑම දේශපාලන පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට වෙනස් ලෙස සැලකීමක් සිදුවන පරිදි ක්‍රියා නොකළ යුතු ය. ගුවන්විදුලි හෝ රූපවාහිනි ආයතනවල ගුවන් කාලය වෙන් කිරීමේදී සහ පුවත්පත්වල ඉඩ ලබා දීමේදී කිසිදු දේශපාලන පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට විශේෂ ප්‍රතිලාභයක් ලබා නොදිය යුතු බව ද උපමානවල සඳහන් වේ.[5] ඉහත කරුණු වලට අමතරව, උපමාන මගින් වැඩසටහන් ඉදිරිපත් කරන්නන් සහ රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකා නිවේදකයින් සඳහා නිශ්චිත යුතුකම් සහ වගකීම් දක්වා ඇත.[6] මීට අමතරව, දැනටමත් තමා දැනුවත්ව සිටින කිසියම් දේශපාලන බැඳීමක් හේතුවෙන් මධ්‍යස්ථභාවය හා අපක්ෂපාතීත්වය පවත්වාගනෙයාමට නොහැකි වීමට ඉඩ ඇති අවස්ථාවක ඒ බව ඕනෑම විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය ආයතනයක සභාපති, මණ්ඩල සාමාජිකයින්, අධ්‍යක්ෂකවරුන් සහ මාධ්‍යවේදීන් විසින් තමන් දේශපාලන කටයුතුවලට සම්බන්ධ වන බව ලිඛිතව හෙළිදරව් කිරීමට ද එමගින් නියම කර ඇත.[7] තවද, මෙම උපමාන පිළිපැදීම සඳහා මාධ්‍ය ආයතනවල හිමිකරුවන්, පරිපාලකයින් මෙන්ම සමාජ මාධ්‍ය භාවිතා කරන්නන් වගකිව යුතුය.[8]

[3] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (5) (අ) වගන්තිය යටතේ මාධ්‍ය උපමාණ, මැතිවරණ කොමිෂන් සභාව, අතිවිශේෂ ගැසට් පත්‍ර 2019 සැප්තැම්බර් 21 දිනැති අංක 2141/87,. කොමිසම පසුව අතිරේක ගැසට් පත්‍ර මගින් වැඩිදුර මාර්ගෝපදේශ නිකුත් කළේය. 2019 ඔක්තෝබර් 27 දිනැති අංක 2146/39, දරන ගැසට් පත්‍රය, ඡන්ද මධ්‍යස්ථාන ඡායාරූප ගත කිරීම, නිල නොවන ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සහ දේශපාලන අයිතිවාසිකම් නොමැති රජයේ නිලධාරීන්ගේ හෝ සන්නද්ධ හමුදාවේ හෝ පොලිසියේ සාමාජිකයින්ගේ ඡායාරූප හෝ ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම සම්බන්දව අදාල වේ.

[4] 2001 දී 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි XIVA පරිච්ඡේදය මගින් මැතිවරණ කොමිෂන් සභාව හඳුන්වා දෙන ලදී. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම වනුවෙනේ සියලූම මාධ්‍ය නියාමනය කිරීම පිනිස උපමාණ නිකුත් කිරීමට 104ආ (5) වගන්තිය මගින් මැතිවරණ කොමිෂන් සභාවට බලය ලබා දී තිබූ අතර ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිණි සංස්ථාව විසින් උල්ලංඝණයන් සිදු කරන්නේ නම් ඒ සඳහා නිසි බලදරයකෙු පත් කිරීමට බලය විය. 2015 දී 19 වන ව්‍යවස්ථා සංශෝධනය 104 ආ (5) වගන්තිය සංශෝධනය කර ස්වාධීන රූපවාහිනී සේවය සහ රජය සතු හෝ රජය විසින් පාලනය කරෙනෙ වෙනත් සෑම ගුවන්විදුලි හෝ රූපවාහිනී විකාශන ආයතනයක් මී ඇතුළත් කිරීම සඳහා රජය සතු මාධ්‍ය ආයතන කාණ්ඩය පුළුල් කළේය. මෙම සංශෝධනය මගින් නිසි බලදාරී යන තනතුරී ඉවත් කර 104උඋ වගන්තිය හඳුන්වා දුන් අතර එම වගන්තිය මගින් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන උපදෙස් වලට අනුකුල නොවීම වරදක් වන බව දක්වා තිබේ.

[5] ඉහත පාද සටහන, මාධ්‍ය උපමාණ අංක 2

[6] ඉහත පාද සටහන, මාධ්‍ය උපමාණ අංක 3 සහ 4

[7] ඉහත පාද සටහන, මාධ්‍ය උපමාණ අංක 15

[8] ඉහත පාද සටහන, මාධ්‍ය උපමාණ අංක 31

ඉහත උපමාන අනුව, මාධ්‍ය නියාමනය සම්බන්ද මැතිවරණ කොමිෂන් සභාවේ වර්තමාන ප්‍රවේශය පහත කරුණු අපට පෙන්වා දෙයි;

i. පුද්ගලික මාධ්‍ය නියාමනය කිරීම සඳහා දැනටමත් හිමි වී ඇති ව්‍යවස්ථාමය බලතල ප්‍රමාණවත් ලෙස භාවිත නොකිරීම

අනුකූල නොවීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් බව උපමානයන්හි සඳහන් වේ.[9] කෙසේ වෙතත්, අනුකූල නොවීමෙහි ප්‍රතිවිපාක මොනවාද යන්න පිළිබඳ උපමාන මගින් වැඩි දුර විස්තර සපයන්නේ නැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104උඋ වගන්තිය මගින් එවැනි මාධ්‍ය උපමානයන්ට අනුකූල නොවීම රුපියල් 100000 දක්වා වූ දඩයක්, හෝ වසර තුනක උපරිම සිර දඬුවමක් හෝ ඒ දෙකින්ම දඬුවම් ලැබිය හැකි වරදක් වන බව සඳහන් වේ. කෙසේවෙතත්, එම ව්‍යවස්ථාමය විධිවිධාන අදාළ වන්නේ රජයේ නිලධාරියෙකුට, රාජ්‍ය සංස්ථාවක සේවකයෙකුට, ව්‍යාපාරයකට හෝ රජයට පවරා ඇති වෙනත් කටයුත්තකට හෝ රජයට සියයට පනහක් හෝ ඊට වැඩි කොටස් ප්‍රමාණයක් හිමි සමාගමකට පමණි. එබැවින් 104උඋ වගන්තියේ ලැයිස්තුගත කර ඇති දඬුවම් අදාළ විය හැක්කේ රාජ්‍ය මාධ්‍ය ආයතනවල අනුකූල නොවීම් සම්බන්ධයෙන් පමණි.

උපමානයන් හී රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය විසින් අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු උපදෙස් අඩංගු වුව ද, පෞද්ගලික මාධ්‍ය ඊට අනුකූල නොවීමේ ප්‍රතිවිපාක නිර්වචනය කිරීමට අපොහොසත් වීමෙන් මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට ලැබෙනෙ අධිකාරී බලය තමන් විසින්ම සීමා කරගෙන ඇත.

පෞද්ගලික මාධ්‍ය සම්බන්ධයනේ උපමාන බලාත්මක කිරීම සහතික කිරීම සඳහා උපමාන තුළ පැහැදිලි විධිවිධාන නොමැතිකම උපමානයන්හි සැළකිය යුතු දුර්වලතාවයකි. 104ආ (5) (අ) වගන්තිය මගින් පුළුල් බලතල ලබා දී තිබියදීත්, කොමිෂන් සභාව තමන් වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පවරා දී ඇති බලතලවල සම්පූර්ණ විෂය පථය උපමානයන් මගින් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සැළකිය යුතු ලෙස සීමා කරගෙන ඇත. පෞද්ගලික මාධ්‍ය විසින් උපමාන උල්ලංඝණය කරන්නේ නම් ගත යුතු නිශ්චිත ක්‍රියාමාර්ග සඳහන් කිරීමට අපොහොසත් වීම බරපතල දුර්වලතාවයකි. එබැවින්, මාධ්‍ය උපමානවලට අනුකූල නොවීමෙන් පුද්ගලික මාධ්‍යවලට අත්වන ප්‍රතිවිපාක මොනවා ද යන්න මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කිරීම වැදගත්ය.

[9] ඉහත පාද සටහන, මාධ්‍ය උපමාණ අංක 33

ii. ක්‍රියාකාරී ලෙස පියවර ගැනීමෙහිලා පවතින දුර්වලත්වය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104උඋ වගන්තියෙන් පරිබාහිරව අපරාධමය දඬුවම් නියම කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට ව්‍යවස්ථාමය බලයක් නොපවතී. කෙසේ වෙතත්, පෞද්ගලික මාධ්‍ය සම්බන්ධයෙන් උපමාන බලාත්මක කිරීමට පියවර ගන්නා බවට කොමිෂන් සභාවට තවමත් ප්‍රකාශ කළ හැකිය. නිදසුනක් ලෙස, එහි උපමාන උල්ලංඝණය කරන පුද්ගලික මාධ්‍ය ආයතන නම් කිරීම සඳහා නිරන්තර අධීක්ෂණ වාර්තා නිකුත් කළ හැකිය. තවද, උල්ලංඝණයන් සිදුවන විට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැනි මාධ්‍ය නියාමන බලධාරීන් සමග විධිමත් ලෙස සන්නිවේදනය කිරීමට ද හැකි ය. ඉන්දියාවේ මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ කාලවල දී ඉන්දීය පුවත්පත් කවුන්සිලය, ප්‍රවෘත්ති විකාශකයින්ගේ සංගමය, ඉන්දීය ජංගම දුරකතන සංගමය සහ සමාජ මාධ්‍ය වේදිකා වැනි නියාමන හා ස්වයං-නියාමන බලධාරීන් කිහිප දෙනෙකු සම්බන්ධ කර ගනිමින් කටයුතු කළ බව අවධාරණය කළ යුතු ය.[10] සන්සන්දනාත්මකව බලන විට, පෞද්ගලික මාධ්‍ය සම්බන්දව 2019 මාධ්‍ය උපමාන බලාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියාකාරී ලෙස කටයුතු කරන බවක් පෙනෙන්නේ නැත.[11]

එබැවින් කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලබා දී ඇති බලතල ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක කර නොමැත. මෙම සන්දර්භය තුළ, රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍යයන් නියාමනයට අදාළව තමන්ට බලාත්මක වීමට හැකි බලතල සඳහන් කරමින් අතිරේක උපමාන නිකුත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට අවස්ථාව පවතී.

නිගමනය

ඉහත සාකච්ඡාවෙන් හෙළි වන්නේ කොමිෂන් සභාව විසින් ජනමාධ්‍යයේ යුතුකම් හා වගකීම් විස්තර කරමින් නිදහස් හා සාධාරණ ජනාධිපතිවරණයක් සහතික කිරීම සඳහා පුළුල් උපමාන නිකුත් කර ඇති බවයි. කෙසේවෙතත්, පෞද්ගලික මාධ්‍යයන් සඳහා මෙම උපමාන ක්‍රියාත්මක කිරීමේදී කොමිෂන් සභාව ගතානුගතික විලාසයෙන්ම ක්‍රියාත්මක වමේින් පවතී. පෞද්ගලික මාධ්‍ය, මාධ්‍ය උපමානයන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වූ විට කොමිසම විසින් ගනු ලබන ක්‍රියාමාර්ග සඳහන් කිරීමෙන් සහ අනෙකුත් නියාමන ආයතන සමගින් ක්‍රියාකාරීව වැඩ කටයුතු කිරීමෙන් මෙම අඩු පාඩුව සපුරා ගැනීමට කොමිසමට තවමත් පියවර ගත හැකිය.

[10] ඉන්දියානු මැතිවරණ කොමිෂන් සභාව, 17 වන ලෝක් සභාව 2019 සඳහා මහ මැතිවරණය: මාධ්‍ය සඳහා අත්පොත (2019), https://eci.gov.in/files/file/9785-handbook-for-media/ [අවසන් වරට ප්‍රවේශ වූයේ 2019 නොවැම්බර් 4]

[11] 'මැතිවරණ කොමිෂන් සභාව ස්වාධීන රූපවාහිනී සේවයෙහි දේශපාලන වැඩසටහන් පැවැත්වීම තහනම් කරයි' the News First, 2019 නොවැම්බර් 2, https://www.newsfirst.lk/2019/11/02/elections-commission-bans-itn-from-conducting-political-programs/ [අවසන් වරට පිවිසුනේ 2019 නොවැම්බර් 4]